සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය-2024
க.பொ.த (உயர்தர) உதவிப் பரீட்சை-2024
Support Test Paper for G.C.E (A/L)

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade | 13 | විෂය / பாடம் / Subject | දේශපාලන විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper | I | පැය / மணித்தியாலம் / Hours | 02 |

උපදෙස් -

- මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත ය.
- A කොටස බහුවරණ ප්‍රශ්න 30කින් සහ B කොටස කෙටි පිළිතුරු සැපයීම් ප්‍රශ්න 20කින් යුක්ත වේ.
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
- එක් ප්‍රශ්නයකට ලකුණු දෙක බැගින් මුළු ලකුණු 100 කි.
- මෙම ප්‍රශ්න පත්‍රය සඳහා කාලය පැය දෙකකි.

## A කොටස

අංක 1 සිට 20 තෙක් ඇති ප්‍රශ්නවලට නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

01) දේශපාලනය සම්බන්ධයෙන් වඩාත් නිවැරදි වන්නේ

1. පරිපාලකයින්ට පමණක් අනන්‍ය වූ මාතෘකාවකි.
2. ජනතාව අතර පවතින්නේ සාධනීය වටහාගැනීමක් පමණි.
3. පුරවැසියා හා රාජ්‍ය අතර පවතින හාවිතයකි.
4. දේශපාලනය යනු බහුමානීය සංකල්පයක් නොවේ.
5. එය සැමවිටම සදාචාරයට පටහැනි ක්‍රියාවකි.

(--------)

02) දේශපාලන විද්‍යාව

1. සාම්ප්‍රදායික දේශපාලන විද්‍යාව, විද්‍යාත්මක චින්තනය මත පදනම් විය.
2. 19 වන සියවසේදී එය සමාජීය විද්‍යාවක් ලෙසින් හැඳින්විය.
3. එය ව්‍යවහාරික දැනුම මත පදනම් වේ.
4. ප්‍රතිමානීය අධ්‍යයනයට පමණක් සීමා වේ.
5. ශුද්ධ විද්‍යාවක් ලෙසින් හඳුනාගත නැකිය.

(--------)

03) දේශපාලන විද්‍යාවේ දාර්ශනික ප්‍රවේශය

1. නිරවද්‍යතාවය සහතික කරගත් කරුණු මත හදාරයි.
2. ලැබෙන නිගමන වාස්තවික වේ.
3. දේශපාලනය හැදෑරීමේ ප්‍රධානම අධ්‍යයන ප්‍රවේශයක් නොවේ
4. ප්‍රතිමානීය විනිශ්චය මත පදනම් වේ.
5.

04) රාජ්‍යය

1. සමාජය පාලනය කරන ආයතන වල එකතුවයි.
2. රාජ්‍යය යනු ආනුභවික සංවිධානයක් වේ.
3. රාජ්‍යයේ පැවැත්ම තීරණය කිරීමට ආණ්ඩුවට හැකිය.
4. රාජ්‍යයේ ස්වාමියා වන්නේ ආණ්ඩුවයි.
5. රාජ්‍යයේ අධිකාරී ක්ෂේත්‍රය පැහැදිලි එකක් නොවේ. (--------)

05) විද්‍යාත්මක අධ්‍යයන ප්‍රවේශය

1. ආනුභූතික නොවන දත්ත මත හදාරයි.
2. ගුණාත්මක දත්ත පිළිබඳව සැලකිලිමත් වේ.
3. චර්යාව ප්‍රධානම අධ්‍යයන ප්‍රස්තුතය නොවේ.
4. හොඳ නරක විනිශ්චය මත පදනම් වේ.
5. ප්‍රත්‍යක්ෂමූලික කරුණු ඔස්සේ හදාරයි. (--------)

06) ආණ්ඩුව

1. දිගුකාලීන පැවැත්මක් ඇත.
2. රාජ්‍යයේ කාර්යයන් ක්‍රියාවට නංවන ප්‍රායෝගිකයා වේ.
3. ආණ්ඩුව හා රාජ්‍යය සමාන ය.
4. ප්‍රායෝගික නොවන සංවිධානයක් ය.
5. ස්වාධිපත්‍ය බලය හිමි කේන්ද්‍රීය ආයතනය වේ. (--------)

07) සමාජ ප්‍රජාතන්ත්‍රවාදය

1. පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය වැදගත් නොවේ.
2. 16 වන සියවසේදී කම්කරු පන්ති ව්‍යාපාර මුල් කරගෙන ආරම්භ විය.
3. ධනවාදය හා සමාජවාදය යන මතධාරාවන් මිශ්‍ර වූ මතවාදයකි.
4. සමාජ ප්‍රජාන්ත්‍රවාදීන් සැමවිටම විප්ලවවාදී මාවත පිළිගනියි.
5. ධනවාදී පිළිවෙත් පිළිබඳ දැඩි විශ්වාසයක් ඇත. (--------)

08) නීතියේ ආධිපත්‍යය

1. ජර්මන් සහ ඇමෙරිකානු සංකල්ප මත පදනම් වේ.
2. පාලකයාට එක් නීතියක් පැවතීම පිළිගනියි.
3. ප්‍රජාවට වගවීම සහතික නොකරයි.
4. පාලිතයන් පමණක් නීතියට අවනත විය යුතුය.
5. එය නීතියේ පාලනය නොව මිනිසුන්ගේ පාලනයයි. (--------)

09) ජාතික වාදය

1. නිශ්චිත දාර්ශනික පදනමක් ඇත.
2. නිශ්චිත පොදු සංස්කෘතික අනන්‍යතාවයක් ඇත.
3. ජාතිකවාදයේ ව්‍යුහය රාජ්‍යයෙන් රාජ්‍යයට වෙනස් ය.
4. ජාතික වාදය මුලින්ම බිහිවූයේ යුරෝපයෙන් බැහැරව ය.
5. ප්‍රජාවක් තුළ පොදු හැඟීමක් ඇති නොකරයි. (--------)

10) ස්ත්‍රී වාදය

1. ගැහැණු හා පිරිමි වෙන්කළ යුතු බව අවධාරණය කරයි.
2. බොහෝ වෙනස්කොට සැලකීම් ගැන සැලකිලිමත් නොවේ.
3. පිරිමින්ගේ පර්යාවලෝකනයෙන් ස්ත්‍රීන්ගේ ලෝකය විග්‍රහ කරයි.
4. ස්ත්‍රී පුරුෂ සමානාත්මතාවය එහි මූලික හරය බවට පත්වේ.
5. සමාජවාදී ස්ත්‍රීවාදය එහි පළමු රැල්ල ලෙසින් මතු විය. (--------)

11) සහසන්ධීය ආණ්ඩු ක්‍රමය සම්බන්ධයෙන් අදාළ නොවන්නේ

1. එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහසන්ධීය වේ.
2. මුල්කාලීන ඇමෙරිකාව ද සහසන්ධීය විය.
3. වර්තමානයේ ස්විට්සර්ලන්තයේ ක්‍රියාත්මක වන ආකෘතියකි
4. එකිනෙකට ස්වාධීන රාජ්‍යයන් අතර ඇතිවන සංවිධිත ගිවිසුමකි.
5. මධ්‍යම ආණ්ඩුව ඉතා බලවත් වන ආණ්ඩු ක්‍රමයකි. (--------)

12) සංවරණ හා තුලන න්‍යාය,

1. ආණ්ඩුවේ ආයතන එකිනෙකා සංවරණය කළ යුතුය.
2. සංවරණය විය යුත්තේ ජනතා බලයයි.
3. එක් ආයතනයක් බලවත් වීමක් දැකිය හැකිය.
4. බ්‍රිතාන්‍යයේ පාලන මූලධර්මයක් ලෙස යොදාගෙන ඇත.
5. සංවරණය හා තුලනය සඳහා බලතල බෙදීම අත්‍යවශ්‍ය අංගයක් නොවේ. (--------)

13) ජනාධිපති ආණ්ඩු ක්‍රමය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය වන්නේ

1. විධිමත් පුද්ගල බෙදීමක් ක්‍රියාත්මක වේ.
2. ආණ්ඩුව ස්ථාවර හා ශක්තිමත් වේ.
3. තීරණ ගැනීම ක්‍රියාවලිය වේගවත් නොවේ.
4. ඒකාධිපති පාලනයක් දක්වා පරිණාමය විය හැකිය.
5. සංවරණය හා තුලනය ක්‍රියාත්මක වේ. (--------)

14) ශ්‍රී ලංකාවේ ආණ්ඩු ක්‍රමයේ ඇති ප්‍රජාතන්ත්‍රවාදී නොවන අංගයක් වන්නේ

1. සාපේක්ෂ වශයෙන් අධිකරණය ස්වාධීන වීම.
2. විධායකය විසින් අධිකරණය හා ව්‍යවස්ථාදායකය පාලනය කිරීම.
3. බලය විමධ්‍යගතකරණ ක්‍රියාවලිය.
4. මහජනයා විසින් පත් කරන ව්‍යවස්ථාදායකය.
5. සක්‍රීය සිවිල් සමාජ ව්‍යාපාර වැඩි වශයෙන් ක්‍රියාත්මක වීම. (--------)

15) ඇමෙරිකානු ආණ්ඩු ක්‍රමය,

1. ඇමෙරිකානු ව්‍යවස්ථාව දෘඪ ව්‍යවස්ථාවක් නොවේ.
2. මධ්‍යම ආණ්ඩුව වර්තමානයේ දුර්වල වී ඇත.
3. ඉතා කුඩා ලියවිල්ලක් වන අතර, එය දළ සැකිල්ලක් පමණි.
4. ප්‍රාන්ත වලට ව්‍යංගික බලයක් ලබාදී තිබීම, තවත් විශේෂත්වයකි.
5. ආණ්ඩු ක්‍රමයේ සඳහන් වන්නේ ප්‍රාන්ත බලතල පමණි. (--------)

16) රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ

1. ජනතාවගේ පුද්ගලික ප්‍රශ්න දෙස අවධානය යොමු කරයි.
2. පොදු ප්‍රශ්න සම්බන්ධව තීරණ ගැනීමේ ක්‍රියාවලියයි.
3. ප්‍රතිපත්ති දැවෙන අගුරුවලට සමාන කර ඇත.
4. ප්‍රතිපත්ති යනු නිමක් නැති ක්‍රියාවලියකි.
5. ආණ්ඩුව කරන්නේ කුමක්ද? නොකරන්නේ කුමක්ද? පැහැදිලි කරයි. (--------)

17) ගැටුම

1. එදිරිවාදිකම හා ගැටුම යනු එකකි.
2. ගැටුම සැමවිටම ප්‍රචණ්ඩකාරී වීම දැකිය හැකි ලක්ෂණයක් වේ.
3. ගැටුම සැමවිටම පුද්ගලයාගේ බාහිර ක්‍රියාකලාපයක් වේ.
4. සමනය කළ නොහැකි අරමුණු නිසා ඇති වන්නකි.
5. ගැටුම සැමවිටම සමාජයට නිශේධනීය කාර්යයක් ඉටු කරයි. (--------)

18) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය

1. තනි පක්ෂ ආධිපත්‍යයක් ගෙන ඇත.
2. එය අධිපති තනි පක්ෂ ක්‍රමයක් දක්වා වර්ධනය වී ඇත.
3. ජනවාර්ගික අනන්‍යතාවය අදාළ කරගෙන නැත.
4. 1970 න් පසු පැරණි වාමාංශික පක්ෂ ශක්තිමත් වී ඇත.
5. වර්තමානයේ බොහෝ සෙයින් බහු පක්ෂ ක්‍රමයක් බවට පත්ව ඇත. (--------)

19) සමාජ සම්මුතිවාදය

1. රාජ්‍යයට දෙවියන් පිළිබඳ සංකල්පය එක් කලේය.
2. තෝමස් හොබ්ස් රාජාණ්ඩුවේ බලය සාධාරණීකරණය කලේය.
3. ජෝන් ලොක් ජනතා පරමාධිපත්‍ය බලය අවධාරණය කලේය.
4. රූසෝ පාර්ලිමේන්තු ස්වාධිපත්‍ය ගැන අදහස් දැක්විය.
5. රූසෝට අනුව පාලකයා ට විරුද්ධ විය නොහැකිය. (--------)

20) ලෝක දේශපාලන ක්‍රමය

1. කලාපීය බලවතුන් නිර්මාණය කර ඇත.
2. වර්තමානයේ ඒක ධ්‍රැවීය ක්‍රමයක් බවට පත් ව ඇත.
3. ද්වි ධ්‍රැවීය ක්‍රමයක් බවට වර්තමානයේ පත්ව ඇත.
4. සමාජවාදී කඳවුරේ ප්‍රමුඛ රටවල ආර්ථික ප්‍රතිපත්ති පරිවර්තනය වී නැත.
5. සාම්ප්‍රදායික කඳවුරුකරණය අභියෝගයට ලක් ව නැත. (--------)

- **අංක 21 සිට 25 තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශ කාණ්ඩය ඇතුළත් වරණය තෝරන්න.**

21) ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයෙන් ඇති වූ ප්‍රජාතන්ත්‍රවාදී පරිවර්තන.

A. ජනතා පරමාධිපත්‍යයේ බලය ශක්තිමත් වීම.
B. මහජනතාවට වගකියන දේශපාලඥයින් බිහිවීම.
C. සමාජ සජීවීකරණය වේගවත් වීම.
D. ප්‍රජා සහභාගීත්ව ආණ්ඩුකරණය
E. ජනවාර්ගික කණ්ඩායම් බහිෂ්කරණය වීම.

01) ABDE 02) BCDE 03) ACDE 04) ABCE 05) ABCD (--------)

22) 1978 මූලික අයිතීන්

A. මූලික අයිතියක් ලෙසින් ජීවත්වීමේ අයිතිය පිළිගෙන ඇත.
B. 15 වන වගන්තියෙන් මූලික අයිතීන් සීමා සඳහන් ව ඇත.
C. මූලික අයිතීන් සම්බන්ධයෙන් 03 වන පරිච්ජේදය අදාළ වේ.
D. අයිතීන් කඩ වූ විට ගත හැකි ක්‍රියාමාර්ග සහිත විය.
E. 1972 ව්‍යවස්ථාවේ අයිතිවාසිකම්වලට වඩා සවිස්තරාත්මක වේ.

01) ABCD 02) ACDE 03) ABDE 04) BCDE 05) ABCE (--------)

23) 1972 ව්‍යවස්ථාව

A. ජාතික රාජ්‍ය සභාව ජනරජයේ උත්තරීතර උපකරණය වේ.

B. පනත් විචාරණය කිරීමේ බලය ශ්‍රේෂ්ඨාධිකරණයට හිමි නොවුණි.

C. මූලික අයිතීන්වල සුරක්ෂිතභාවයක් ඇති කරන ලදි.

D. රාජ්‍ය සේවය අමාත්‍ය මණ්ඩලය යටතට ගෙන එන ලදි.

E. බලතල බෙදීම මූලධර්මයක් ලෙසින් හඳුන්වා දෙන ලදි.

01) ABCD 02) ACD 03) ABD 04) BDE 05) ABCE (--------)

24) ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය

A. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ප්‍රමුඛ ආණ්ඩු ආසියානු ගැති විදෙස් පිළිවෙතක් අනුගමනය කරයි.

B. භෞමික වශයෙන් කුඩා රාජ්‍යයක් වීම, ශ්‍රී ලංකාවට අභියෝගයක් ව ඇත.

C. එක්සත් ජාතික පක්ෂය බටහිර ගැති විදෙස් පිළිවෙතක් අනුගමනය කර ඇත.

D. 1977 න් පසු ශ්‍රී ලංකාව සිය ආර්ථික ස්වාධිපත්‍ය මත විදෙස් පිළිවෙත තීරණය කරයි.

E. පසුකාලීනව එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු ආසියානු ගැති විදෙස් පිළිවෙතක් අනුගමනය කරයි.

01) ABCE 02) BCDE 03) ACDE 04) ABDE 05) ABCD (--------)

25) ජාත්‍යන්තර දේශපාලනය

A. ගොඩනගා ගෙන ඇති ජාත්‍යන්තර දේශපාලන පර්යායන් මත ක්‍රියාත්මක වේ.

B. ජාත්‍යන්තර දේශපාලනය පාලනය කරන්නේ ලෝක ආණ්ඩුව මගින් ය.

C. නිරන්තරයෙන් විවිධ ක්‍රියාධරයින්ගේ බලපෑමට ලක්වී ඇත.

D. ආරාජික ස්වභාවය එයට අනන්‍ය ලක්ෂණයකි.

E. ජාත්‍යන්තර දේශපාලනය යනු ජාතීන් අතර දේශපාලනයයි.

01) ABCD 02) BCDE 03) ABDE 04) ACDE 05) ABCE (--------)

අංක 26 සිට 30 දක්වා ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දී ඇත. ඒ එක් එක් ප්‍රශ්න අංකයට අදාළ ඇති යෙදුම් යුගලය සම්බන්ධයෙන් පහත 1 වගුව සඳහා වන යොමුවෙහි සඳහන් 1,2,3,4, සහ 5 යන වරණ වලින් සුදුසු වරණය තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | I වන ප්‍රකාශය | II වන ප්‍රකාශය |
|---|---|---|
| 1 | සත්‍යය | සත්‍යය |
| 2 | සත්‍යය | අසත්‍යය |
| 3 | අසත්‍යය | සත්‍යය |
| 4 | අසත්‍යය | අසත්‍යය |
| 5 | සත්‍යය | සත්‍ය වන අතර, පළමු ප්‍රකාශය තවදුරටත් පැහැදිලි කරයි. |

| | I වන ප්‍රකාශය | II වන ප්‍රකාශය | |
|---|---|---|---|
| 26) | 1978 දෙවන ජනරජ ව්‍යවස්ථාවෙන් ජනතා පරමාධිපත්‍ය බලය පිළිගෙන ඇත්තේ ය. | ජනතා පරමාධිපත්‍ය බලය පාර්ලිමේන්තුව තුළින් පමණක් ක්‍රියාත්මක වන බව 1978 ව්‍යවස්ථාවේ දැක්වේ. | (--------) |
| 27) | 1978 මුල් ව්‍යවස්ථාව තුළ සමානුපාතික මැතිවරණ ක්‍රමය හඳුන්වා දී ඇත. | 1978 ව්‍යවස්ථාවේ 12 වන සංශෝධනයෙන් ජාතික ලැයිස්තුව හඳුන්වා දී ඇත. | (--------) |
| 28) | 1978 ව්‍යවස්ථාවට ගෙන එන ලද 19 වන සංශෝධනයට අනුව අගමැතිවරයා ඉවත් කිරීමට ජනාධිපතිවරයාට නොහැකිය . | 1978 ව්‍යවස්ථාවේ 42(4) වන වගන්තියට අනුව ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුතුය. | (--------) |
| 29) | 1978 මුල් ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා නීතිය හමුවේ විශේෂීකරණයට ලක්කර ඇත. | 1978 මුල් ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා ට එරෙහිව සිවිල් හා අපරාධ නඩු මෙන්ම මූලික අයිතීන් සම්බන්ධ නඩු ද පැවරිය නොහැකි ය. | (--------) |
| 30) | 1978 මුල් ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයාට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් භුක්ති විඳින සියලු අයිතීන් හා වරප්‍රසාද හිමි වේ. | 1978 ව්‍යවස්ථාවට ගෙන එන ලද සංශෝධන වලට අනුව දෙමුහුන් ව්‍යවස්ථාවක් නිර්මාණය වී ඇත. | (--------) |

## B කොටස

31) දේශපාලනය සම්බන්ධයෙන් ශාස්ත්‍රීය වශයෙන් ඉදිරිපත්ව ඇති ප්‍රවාද දෙකක් සඳහන් කරන්න.

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

32) "යුක්තිය පිළිබඳ න්‍යාය" හා "දේශපාලනය වෘත්තියක් වශයෙන්" යන කෘතීන් ලියන ලද දාර්ශනිකයින් සඳහන් කරන්න.

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

33) "සීමිත ආණ්ඩුකරණය යන අදහස වර්ධනය කළ නූතන දාර්ශනිකයින් දෙදෙනෙක් සඳහන් කරන්න.

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------------------

34) පහත දැක්වෙන ප්‍රකාශයන්ට අදාල ආයතන වර්ගය සඳහන් කරන්න.

1) මිනිසාගේ දේශපාලන සාමූහිකත්වයේ අවසාන ප්‍රකාශනයයි.

2) ජනතාවගෙන් සුජාතභාවයක් ලබා නොගත්, මහජන පරිමණ්ඩලය තුළ ක්‍රියාත්මක, දේශපාලන පුද්ගලික අභිලාශ රාශිගත කරන ආයතන වර්ගයකි.

35) ස්ත්‍රීවාදීන් සාම්ප්‍රදායික දේශපාලනය පිළිබඳ මතු කරන ප්‍රශ්න දෙකක් සඳහන් කරන්න.

36) මැතිවරණ ක්‍රියාවලියක තිබිය යුතු කොන්දේසි අතරින් පහත දැක්වෙන කොන්දේසි දෙකෙන් දැක්වෙන අදහස සඳහන් කරන්න.

I. අර්ථවත්භාවය

II. අන්තහ්කරණය

37) ප්‍රජාවට වගවීම සම්බන්ධයෙන් නූතන රාජ්‍යයන් තුළ ක්‍රියාත්මක යාන්ත්‍රණ දෙකක් සඳහන් කරන්න.

38) රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් නිර්මාණය වීම සඳහා බලපාන සාධක දෙකක් සඳහන් කරන්න

39) ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය කෙරෙහි බලපාන සාධක දෙකක් සඳහන් කරන්න.

40) බ්‍රිතාන්‍ය ආණ්ඩු ක්‍රමයේ පදනම් මූලධර්ම දෙකක් සඳහන් කරන්න.

41) රාජ්‍යයක් සිය විදෙස් පිළිවෙත ක්‍රියාත්මක කරන්නා වූ ක්‍රමවේද දෙකක් නම් කරන්න.

42) සාමය ගොඩනැගීම දෙයාකාර වේ. එම ආකාර දෙක සඳහන් කරන්න.

43) ප්‍රංශයේ පරිපාලනය විමධ්‍යගත කර ඇති ආයතන දෙකක් සඳහන් කරන්න.

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

44) ස්විට්සර්ලන්තයේ සහසන්ධීය ක්‍රමය ක්‍රියාත්මක වන්නේ මූලික සිද්ධාන්ත දෙකක් මත ය. එම සිද්ධාන්ත දෙක සඳහන් කරන්න.

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

45) ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරන ලද නෛතික ප්‍රතිපාදන දෙක සඳහන් කරන්න.

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

46) රාජ්‍ය ප්‍රතිපත්ති උපදේශනය සපයන ආයතන දෙකක් සඳහන් කරන්න.

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

47) ඉන්දියානු ආණ්ඩු ක්‍රමයට අනුව ප්‍රාන්ත රාජ්‍යයන් සංඛ්‍යාව සහ සාංගමික ප්‍රාන්ත ගණන සඳහන් කරන්න.

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

48) වාර්ගික නියෝජනය හා ප්‍රාදේශිය නියෝජනය හඳුන්වාදුන් යටත් විජිත ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණ පිළිවෙලින් සඳහන් කරන්න.

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

49) මැක්ස් වෙබර් පෙන්වා දෙන නිලබල ක්‍රමයක ලක්ෂණ දෙකක් සඳහන් කරන්න.

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

50) 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 2 වගන්තිය හා 9 වන වගන්තියේ ඇති විධිවිධාන පිළිවෙලින් සඳහන් කරන්න.

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

--------------------------------------------------------------------------------

සියලු හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

අ.පො.ස (උසස් පෙළ) උපකාරක පරීක්ෂණය-2024
க.பொ.த (உயர்தர) உதவிப் பரீட்சை-2024
Support Test Paper for G.C.E (A/L)

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 13 | විෂයය / பாடம் / Subject: දේශපාලන විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 03 |

උපදෙස් -

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත ය.
- I කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද, II කොටසින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් ද, III කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද, වන සේ තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- විනාඩි 10ක අමතර කියවීම් කාලයක් හිමි වේ.

## I කොටස

01) දේශපාලනය හැදෑරීමේ දාර්ශනික ප්‍රවේශය විස්තර කරන්න. (ලකුණු 20 යි)

02) පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකක් පිළිබඳ ව සාකච්ඡා කරන්න.

I. නූතන ජාතික රාජ්‍යය හා ගෝලීයකරණය
II. යටත් විජිත රාජ්‍යය හා පශ්චාත් යටත් විජිත රාජ්‍යය
III. ඒකීය හා සන්ධීය ආණ්ඩු ක්‍රම අතර වෙනස්කම් (ලකුණු 10 × 2 = 20 යි)

03) පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකක් පිළිබඳ ව විස්තර කරන්න.

I. සමූහාණ්ඩුවාදී සහ ලිබරල්වාදී මතවාද අතර වෙනස
II. සිවිල් සමාජය
IV. නීතියේ ආධිපත්‍යය. (ලකුණු 10 × 2 = 20 යි)

## II කොටස

04) ඩොනමෝර් ආණ්ඩු ක්‍රමයෙන් ඇතිකරන ලද ප්‍රජාතාන්ත්‍රික පරිවර්තනය විස්තර කරන්න. (ලකුණු 20 යි)

05) පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකක් පිළිබඳ ව සාකච්ඡා කරන්න.

I. 1947 සහ 1972 ආණ්ඩු ක්‍රමවල රාජ්‍ය සේවය
II. 1978 මූලික අයිතිවාසිකම් හා එහි දුර්වලතා
III. 1972 ජාතික රාජ්‍ය සභාවේ උත්තරීතරභාවයට අදාළ විධිවිධාන (ලකුණු 10 × 2 = 20 යි)

06) පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකක් පිළිබඳ ව සාකච්ඡා කරන්න. (ලකුණු 20 යි)

I. 1947 සහ 1972 ආණ්ඩු ක්‍රමවලට නාමික විධායකය

II. 1978 ජනාධිපතිවරයා තෝරාපත් කිරීම

III. 1978 ජනාධිපතිවරයාගේ බලතල වැඩි කිරීම (ලකුණු 10 × 2 = 20 යි)

07) අධිකරණමය ස්වාධීනත්වය පිළිබඳ න්‍යාය පැහැදිලි කර එය 1978 ආණ්ඩු ක්‍රමය තුළ භාවිතය පිළිබඳ ව සාකච්ඡා කරන්න. (ලකුණු 20 යි)

## III කොටස

08) "ස්විට්සර්ලන්ත ආණ්ඩු ක්‍රමය සහසන්ධීය ආණ්ඩු ක්‍රමයක් වුවද, වර්තමානයේ සන්ධීය ලක්ෂණ පෙන්නුම් කරයි". සාකච්ඡා කරන්න. (ලකුණු 20 යි)

09) පහත දැක්වෙන මාතෘකා අතරින් දෙකක් පිළිබඳ ව විස්තර කරන්න.

I. ගැටුම් චක්‍රය

II. ජාත්‍යන්තර දේශපාලයේ රාජ්‍ය නොවන ක්‍රියාධරයින්

III. ශ්‍රී ලංකාවේ විදෙස් පිළිවෙත හා ප්‍රවණතා (ලකුණු 10 × 2 = 20 යි)

10) පහත දැක්වෙන ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

I. [illegible]

II. ශ්‍රී ලංකාවේ පක්ෂ ක්‍රමයේ ලක්ෂණ හා ප්‍රවණතා

III. ශ්‍රී ලංකාවේ ප්‍රජාතන්ත්‍රවාදී හා ප්‍රජාතන්ත්‍රවාදී නොවන අත්දැකීම්

IV. සංවරණ හා තුලන න්‍යාය හා භාවිතය

V. රාජ්‍ය ප්‍රතිපත්ති චක්‍රය (ලකුණු 10 × 2 = 20 යි)

PARCEL NO

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්

PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

## සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න